ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

10 ශ්‍රේණිය ප්‍රථම වාර පරීක්ෂණය – 2019 මාර්තු

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

කාලය: පැය දෙකයි

සටහන:

I. පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
II. පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර,අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ

1.

I. **2000MB , 3GB සහ 600MB ධාරිතාවෙන් යුතු මෘදුකාංග 3 ක් අමල් ලඟ ඇත. ඒවා ඔහුගේ මිතුරකුට ලබා දීම සඳහා ඔහුගේ 5620 MB ධාරිතාවයෙන් යුතු සැණෙලි මතකයක් භාවිතයට අපේක්ෂා කරයි.එම කාර්ය සඳහා එම සැණෙලි මතකය ප්‍රමාණවත්ද? ඔබගේ ගණනය කිරීම් පැහැදිලිව දක්වන්න.**

II. **පහත ප්‍රකාශ හරි හෝ වැරදි බව ප්‍රකාශ කරන්න**

A. **පරිගණක තිර සෑදීම සඳහා ආලෝක විමෝචක දියොඩ තාක්ෂණය භාවිතා කරයි.**

B. **USB කෙවෙනි වලට සම්බන්ධ කළ හැක්කේ සැණෙලි මතක පමණි.**

C. **සසම්භාවී ප්‍රවේශ මතක මධ්‍ය සැකසුම් ඒකකය තුළ ස්ථාපනය වී ඇත.**

D. **ශ්‍රී ලංකා සිතියම E- රාජ්‍ය මගින් වෙනත් රාජ්‍යයන් (G2G) සඳහා ලබා දෙන පහසු කමකි.**

III. **දූරස්ථ අධ්‍යාපනයේ පවත්නා ලක්ෂණ 2ක් ලියන්න.**

IV. **P සහ Q යන කාර්යාල දෙකේ පිළිවෙළින් ජාල ගත සහ ජාල ගත නොවූ පරිගණක භාවිතා කරයි. Q කාර්යාලයට සාපේක්ෂව P කාර්යාලය ලබන වාසි දෙකක් සඳහන් කරන්න.**

V. **ජංගම දුරකතනයක් භාවිතයෙන් භාණ්ඩයක් පිළිබඳ වැඩිදුර තොරතුරු නිෂ්පාදන ආයතනයේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමට භාවිතා කල හැකි කේතය කුමක්ද?**

VI. **ආයතනයක පැමිණීම වාර්තා කිරීම සඳහා යොදා ගතහැකි ආදාන උපාංගය නම් කරන්න.**

VII. **පහත ලේබල් කර ඇති අයිතම සඳහා නිවැරදි උදාහරණය පහත ලැයිස්තුවෙන් තෝරා ගෙන ලියන්න. ලේබයය හා උදාහරණය ලිවීම ප්‍රමාණවත් වේ.**

ලැයිස්තුව - බ්ලූ රේ තැටි , වාරක මතකය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය, තීරු කේත කියවනය , මෙහෙයුම් යටිය,ඩිජිටල් කැමරාව

A – දැක්වීමේ උපාංගයකි
B – ප්‍රතිදාන උපාංගයකි
C – සුපරීක්ෂකයකි
D - ද්විතීක ආචයන ඒකකයකි

VIII. **පහත A සිට B දක්වා ලේබල කර ඇති වගන්ති සත්‍ය ද /අසත්‍ය ද යන්න සඳහන් කරන්න. ඔබ විසින් කළ යුත්තේ අදාල ලේබලය ලියා එහි සත්‍ය අසත්‍යතාව සඳහන් කිරීම පමණි.**

A - පරිගණක පද්ධතියෙහි සියළුම උපක්‍රම පාලනය අංක ගණිතමය හා තාර්කික ඒකකය විසින් සිදු කරයි.

B - වාරක මතකය නශ්‍ය නොවන මතකයකි.

C - උෂ්ණත්වය පීඩනය , වෝල්ටීයතාවය ආදී සාධක හඳුනා ගැනීමට ප්‍රතිසම පරිගණක වලට හැකියාව පවති.

D - මතක කාඩ්පත්(memory card) ඝන තත්වයේ (solid state) උපාංග සඳහා උදාහරණයකි.

IX. වගුවේ A තීරයන් හී ඇති කාර්ය හා ගැළපෙන B තීරයේ ඇති පරීක්ෂණ යන්ත්‍ර තෝරන්න. ගැළපෙන ඉංග්‍රීසි අක්ෂර ලිවීම ප්‍රමාණවත් වේ.

A		B	
P	හෘද ස්පන්දනය මැනීම	E	විද්‍යුත් නිකර්පර රේඛණ යන්ත්‍රය (EEG)
Q	හෘදයේ ක්‍රියාකාරීත්වය පරිගණක තිරයක දැක්වීම	F	පරිගණකගත ආක්ෂක ශරීර ස්ථර එක්සරේ යන්ත්‍රය (CAT)
R	ශරිරයේ අභ්‍යන්තර කොටස් ත්‍රිමානව දැක්වීම	G	හෘද රෝග තිරගැන්වීමේ යන්ත්‍රය
S	මොළයේ ක්‍රියාකාරීත්වය දැක්වීම	H	විද්‍යුත් තන්තු රේඛීය යන්ත්‍රය (ECG)

X. පහත කාර්යයන් සඳහා ගැළපෙන නිවැරදි කෙවෙනිය තෝරන්න. අංකය හා කෙවෙනියේ අක්ෂරය යෙදීම ප්‍රමාණවත් වේ.

	කාර්ය		කෙවෙනිය
i.	ස්විචයක් පරිගණකයට සම්බන්ධ කිරීම	A	HDMI
ii.	ඩිජිටල් රූපවාහිනි යන්ත්‍රය උකුළු පරිලණකයට සම්බන්ධ කිරීම	B	USB
iii.	Microphone එක පරිගණකයට සම්බන්ධ කිරීම	C	RJ45
iv.	අංකිත කැමරාව පරිගණකයට සම්බන්ධ කිරීම	D	ශබ්ද උපාංග කෙවෙනිය

2. පරිගණක පද්ධතියක සැකසුම දැක්වෙන පහත රූපසටහන අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



I. A,B,C,D,E,F,G හා H යන හිස්තැන් සඳහා සුදුසු පද අදාළ අක්ෂරය සමග ලියා දක්වන්න.
II. නෂ්‍ය නොවන මතකයක් ලෙස යොදාගත හැකි උපාංගය නිරූපනය කරන අක්ෂරය ලියන්න.
III. G හා B මගින් සිදු කරන කාර්ය කෙටියෙන් ලියන්න.
IV. A, C හා D සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න.

3. පරිගණකයකට සම්බන්ධ කර ඇති විවධ උපාංග පිළිබඳව පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
I. යතුරු පුවරුවක දක්නට ලැබෙන යතුරු වර්ග 4 ක් ලියා උදාහරණ 2ක් බැගින් ලියන්න.
II. ප්‍රධාන වශයෙන් මුද්‍රණ යන්ත්‍ර වර්ග කල හැකි ආකාර දක්වා ඒවාට උදාහරණ 2 බැගින් ලියන්න.
III. දැක්වීම් උපක්‍රම 4 ක් ලියා දක්වන්න.
IV. පරිගණක තිර වර්ග 2ක් ලියා ඒවාට අදාළ වාසියක් හා අවාසියක් බැගින් ලියන්න.

4. පහත දැක්වෙනුයේ වදන් සැකසුම් මෘදුකාංගයක භාවිත වන මෙවලම් කිහිපය රූප සටහනකි.

A.	B.	C.	D.	E.	F.
					

I. එම මෙවලම් නම් කරන්න.

II. එම මෙවලම් යොදා ගනු ලබන්නේ කුමක් සඳහාද යන්න අදාළ අක්ෂරය සමග ලියා දක්වන්න?

III. වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් ලබා දී ඇති පහසුකම් දෙකක් ලියන්න.

IV. වදන් සැකසුම් මෘදුකාංග දෙකක් නම් කරන්න.

5. වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතා කර සකසා ඇති පහත රූප සටහන හොඳින් නිරීක්ෂණය කර අදාළ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

art festival

The school principal has informed that this year’s Art festival is going to be celebrated. The assigned task of you team is preparing necessary documents for the art festival. Accordingly you have to design ***letters, invitations*** and ***certificates.***

1. Design invitations
2. Prepare letters to the parents
3. Design certificates

These documents should be well prepared and printed. After drafting the above documents, you now want to find the best method of document preparation. “we should find attractive types of letters and add pictures. A border will give a good finish. A typewriter won’t provide such facilities, will it?’’

I. රූපයේ දැක්වෙන ආකාරයට ලේඛනය සකස් කිරීමේදී භාවිතා කලයුතු වදන් සැකසුම් පහසුකම් හෝ හැඩසව් ගැන්වීම් මෙවලම් 5ක් ලියන්න.

II. ඉහත දැක්වෙන පළමු ඡේදය පහත දිස්වන ආකාරයට වෙනස් කිරිමට යොදා ගත යුතු මෙවළම කුමක්ද?

The school principal has informed that this year's Art festival is going to be celebrated. The assigned task of you team is preparing necessary documents for the art festival. Accordingly

III. ඉහත ලැයිස්තුව , බුලටීන ලැයිස්තුවක් බවට පත් කිරීමට අනුගමනය කලයුතු පියවර ලියන්න.

IV. ඉහත මාතෘකාවේ සියළු අකුරු කැපිටල් අකුරු බවට හැරවීමට අනුගමනය කලයුතු පියවර ලියන්න.

6.

I. දත්ත **සම්ප්‍රේෂණ මාධ්‍ය** වර්ග දෙක ලියා ඒවා නැවත බෙදෙන ආකාරය වගු ගත කර දක්වන්න.

II. පරිගණක ජාලයක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

III. පරිගණක ජාල භූමියේ පිහිටීම අනුව වර්ග කළ හැකි ආකාර දක්වා කෙටියෙන් විස්තර කරන්න.

7. පහත රූපසටහනින් අන්තර්ජාලය හා සම්බන්ධ වී තිබෙන පරිගණක ජාලයක් පෙන්නුම් කරයි.



I. A, B, C, D හා E මගින් දක්වා ඇති උපාංග හඳුනාගෙන නම් කරන්න.

II. A මගින් සිදු කරන කාර්ය කෙටියෙන් දක්වන්න.

III. ස්විචය හා නාභිය අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.

IV. පරිගණක ජාලගත කිරීමේදි භාවිතා කල හැකි ජාල ස්ථල විද්‍යා දෙකක් නම් කර ඇඳ දක්වන්න.